www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 8 ශ්‍රේණිය | විද්‍යාව | 6- චුම්භක |
|---|---|---|

- **නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

1) පහත ද්‍රව්‍ය අතරින් චුම්බක ද්‍රව්‍යයන් වන්නේ,
I) මැග්නිසියම් II) නිකල් III) ඇලුමිනියම් IV) තඹ

2) චුම්භක පිළිබඳ පහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
a) චුම්භකයක් අවට චුම්බක බලය රැඳී ඇති ප්‍රදේශය චුම්භක ක්ෂේත්‍රය
b) චුම්බකයක චුම්භක බලය වැඩිපුර රැඳී ඇත්තේ චුම්භක ධ්‍රැව වලය

I) a පමණි II) b පමණි III) a හා b පමණි IV) සියල්ලම වැරදිය

3) A හා B චුම්භක වේ.




I) A හා B චුම්භක විකර්ශනය වේ.
II) A හා B චුම්භක ආකර්ශනය වේ
III) A හි උත්තර ධ්‍රැවය හා B හි උත්තර ධ්‍රැවය මෙහි දැක්වේ.
IV) A හා B චුම්භක උදාසීන වේ

4) චුම්භක බල රේඛා ගමන් කරනුයේ,
I) උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වාය
II) දක්ෂිණ ධ්‍රැවයේ සිට උත්තර ධ්‍රැවය දක්වාය
III) බටහිර සිට නැගෙනහිර දක්වාය
IV) නැගෙනහිර සිට බටහිර දක්වාය

5) වඩා ප්‍රබල ස්ථිර චුම්භක නිර්මාණයට භාවිතා කරනුයේ,
I) වානේ II) යකඩ III) ෆෙරයිට් IV) කාබන්

6) 

මෙම චුම්භකය හඳුන්වන්නේ,

I) වලයාකාර චුම්භක II) අශ්වලාඩම් චුම්භක
III) දණ්ඩ චුම්භක IV) ගෝලාග්‍ර චුම්භක

7) චුම්භක ගුණ හානි විය හැකි අවස්ථාවක් නොවන්නේ,
I) ඉහළ උෂ්ණත්වයකට ලක්වීම
II) කම්පන වලට ලක්වීම
III) සුරක්ෂිතව ගබඩා කිරීම
IV) කැඩී යාම

8) ස්ථිර චුම්භක භාවිතා නොවන අවස්ථාවක් වන්නේ,
I) මාලිමාවේ II) කුඩා විදුලි මෝටරවල
III) ස්පීකර් වල IV) විද්‍යුත් දොඹකර වල

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

9) චුම්භකයකට ආකර්ශනය වන ද්‍රව්‍යයකි.

I) මකනය II) ගල් කැටය III) යකඩ ඇණය IV) ප්ලාස්ටික් රූල

10) මාලිමාවක කටුව,

I) දණ්ඩ චුම්භකයකි II) වලයාකාර චුම්භකයකි

III) U චුම්භකයකි IV) අශ්වලාඩම් චුම්භකයකි

- **හිස්තැන් පුරවන්න.**

I) පෘථිවය වටා පවතින චුම්බකත්වය ...................................................... චුම්භකත්වය නම් වේ.

II) පෘථිවිය අභ්‍යන්තරයේ වූ අධික...................................................... නිසා ද්‍රව බවට පත් වූ ...................................................... පෘථිවිය අක්ෂය වටා සංසරණය වේ.

III) පෘථිවියේ චුම්භක උතුර පිහිටන්නේ සැබෑ උතුරට මදක් ...................................................... දෙසිනි.

IV) සැබෑ උතුර හා චුම්භක උතුර අතර අංශක කිහිපයක ...................................................... පවතී.

- **කෙටි පිළිතුරු ලියන්න.**

I) ධ්‍රැව නොදන්නා චුම්භකයක් හා ධ්‍රැව දන්නා චුම්භකයක් භාවිතා කර ධ්‍රැව නොදන්නා චුම්භකයේ ධ්‍රැව හඳුනා ගන්නේ කෙසේද?

II) චුම්භක බල රේඛා යන්න හඳුන්වන්න.

III) සජාතීය ද්‍රැව දෙකක් අසල චුම්භක බල රේඛා පිහිටන ආකාරය ඇඳ පෙන්වන්න.

IV) විද්‍යුත් චුම්භක හඳුන්වන වෙනත් නමක් ලියන්න.

V) ස්ථිර චුම්භක සාදන ප්‍රධාන ආකාර 2 ක් නම් කරන්න.

VI) ඉඳිකටුවක් ස්ථිර චුම්භකයක් බවට පත් කළ හැකි ආකාරය කෙටියෙන් ලියන්න.

**එච්.එම්.ඩී.ටී.ජී. හඳපාන්ගොඩ**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk